# ඊජිප්තු ශිෂ්ටාචාරයේ ශීර්ෂ පලඳනා

බී. එච්. එල්. ඩී. ජයසේන, කෞෂල්‍යා සුභාෂිනී, නිරෝෂා ලක්මාලි[1]

ශීර්ෂ පලඳනා යනු අතීත ශිෂ්ටාචාරයක නො දන්නා කරුණු අනාවරණය කරගත හැකි සාධකයකි. මේ පර්යේෂණය ඊජිප්තු ශිෂ්ටාචාරයේ ශීර්ෂ පලඳනා පිළිබඳ ව අධ්‍යයනයකි. ශීර්ෂ පලඳනා අතර ඔටුනු විශේෂිත ය. විවිධ පුද්ගලයෝ ඔටුනු පැලැන්දහ. රජවරු, රැජිනියෝ, දෙවිවරු හා දරුවෝ ඒ අතර වෙති. ඔටුන්න පැලඳීම පුද්ගල තත්ත්ව අනුව වෙනස් විය. රාජකීයත්වය සහ දේවගැතිවරුන්ගෙන් සැදුම්ලත් සමාජයේ අධිපති බවෙහි භූමිකාව ඔටුන්න පැලඳීමෙන් දක්නට ලැබේ. 'The book of dead' දක්වන පරිදි ඔසිරිස් ප්‍රථම ඔටුන්න පැලඳ ඇත. ස වැනි රාජවංශ කාලයේ දී රාජකීය කාන්තාවන් ද පලඳනාවක් භාවිත කර ඇත. අප්‍රධාන රාජකීය කාන්තාවන් Gazelle මුව වර්ගයකින් සැදූ ඔටුනු පැලඳ ඇත. ශීර්ෂ පලඳනා කාලානුරූපී ව හැඩ, සංකේත, ප්‍රමාණ සහ අමුද්‍රව්‍ය අනුව වෙනස් විය. ඔටුන්න පලඳින පුද්ගලයන්ගේ උසට සරිලන ආකාරයට ඔවුන්ගේ උසස් බව වැඩි වී පෙනෙන ලෙස නිමා විය. ශීර්ෂ පලඳනා සඳහා මැණික්, රත්රන්, රිදී සත්ත්ව කොටස් භාවිත විය. රාජකීය ඔටුනුවල පමණක් කුරුලු පිහාටුවක් යෙදිණි. ගිජු ළිහිණියකුගේ හිසක් ලෙස සැදූ ඔටුනු Nekbbet දේවතාවගේ සොහොනේ තිබී ඇත. ඊජිප්තු ඔටුනු වර්ග 'Atef Beshret Hedget Pschent Cap Cown' විවිධ පුද්ගලයන්ට විශේෂිත ඔටුනු 'Amentel Armen Atem Geb Hathor' ඔසිරිස්, පැලඳි ශ්වේත ඔටුන්න උතුරු හා දකුණු ඊජිප්තුවේ නායකයා සංකේත කරයි. ඔටුන්නේ සංකේත රාජකීයත්වය සහ දේවගැති බව හඳුනාගත හැකි ය. ඔටුන්නක පිහාටු යෙදීමෙන් රාජකීයත්වය වැඩි කර පෙන්වීම අදහස් කරයි. Hutshepsut ගේ ඔටුන්නෙන් අහස පසාරු වන බව සංකේතවත් කරයි. පැරණි මිසර වැසියෝ අවමඟුල් චාරිත්‍රයක සංකේතයක් ලෙස ද ඔටුනු පැලැන්දහ. පිරමීඩ, සොහොන් ගෙවල්, කොනික් පත්‍ර, පුරාණ මිසර රූපාක්ෂර ආදිය ශීර්ෂ පලඳනා පිළිබඳ සාධක සපයයි. සමස්ත ශීර්ෂ පලඳනා අධ්‍යයනයේ දී ආගමික හා දේශපාලනික නීතියකට යටත් ව සැදූ බව පෙනේ. මෙවායින් විශ්වාස, සමාජ තත්ත්ව පුද්ගල වටිනාකම්, බලය සන්නිවේදනය කර ඇති බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** ඊජිප්තු ශිෂ්ටාචාරය, සංකේත, ශීර්ෂ පලඳනා, සමාජ තත්ත්වය, චාරිත්‍ර

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසඟිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය